මාවතගම ප්‍රාදේශීය සභාව - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මාවතගම ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට මාවතගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු

කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති,රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූල නොවීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නොවිසඳුණු නඩු 05 කට අදාළව වර්ෂය තුළ නීතිඥ ගාස්තු ලෙස රු.256,921 ක් ගෙවා තිබුණු අතර ඒ සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.	මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණු නඩු සම්බන්ධව 2025 වසරේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව.	නෛතික තත්ත්වයන් සම්බන්ධයෙන් නිවැරදිව හෙළිදරව් කළ යුතුය.

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.766,331 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.	2025 වසරේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය.
(ආ)	2022 වර්ෂය තුළ ඉඩම් වෙන්දේසි සමාගමකින් සභාවට ලැබුණු ඉඩමේ වටිනාකම රු.1,800,000 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.	2025 වසරේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විවිධ තැන්පත් ශේෂය රු.7,175,910 ක් වැඩිපුර ගිණුම්ගත කර තිබුණි.	2025 වසරේ අවසන් ගිණුම් වාර්තාවෙන් නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂයට අදාළව ඉන්ධන පිරවුම්හලට ගෙවිය යුතු රු.363,388 ක් පොදු සැපයුම් ණය හිමි ගිණුම්වලින් අත්හැරී තිබුණි.	2025 වසරේ අවසන් ගිණුම් වාර්තාවෙන් නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය.
(ඉ)	සමාලෝචිත වර්ෂයට අදාළව ලැබිය යුතු පරිපාලන වියදම් රු.780,462 ක් ප්‍රාග්ධන අධාර ගිණුමෙන් හා ණයගැති ගිණුම්වලින් අත්හැරී තිබුණි.	2025 වසරේ අවසන් ගිණුම් වාර්තාවෙන් නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය.
(ඊ)	මාවතගම පෙර පාසල් ගොඩනැගිල්ලේ කොටසක සිදු කළ වැඩිදියුණු කිරීම වෙනුවෙන් දරන ලද රු.195,338 ක් වත්කම් ලෙස ප්‍රාග්ධනිත කර නොතිබුණි.	2025 වසරේ අවසන් ගිණුම් වාර්තාවෙන් නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය.
(උ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවක ණය රු.137,827 ක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ අඩුවෙන් දක්වා තිබුණි.	කරුණු සොයා බලා නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය.

(ඍ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මුද්දර බදු රු.130,809 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.	කරුණු සොයා බලා නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය.
(එ)	සමාලෝචිත වර්ෂයට අදාළ වෙනත් අයභාර ආදායම් අය ශීර්ෂ 05 ක එකතු වටිනාකම රු.32,267,087 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණි.	2025 වසරේ අවසන් ගිණුම් වාර්තාවෙන් නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය.
(ඒ)	සමාලෝචිත වර්ෂයට අදාළ පුනරාවර්තන වියදම් වැය ශීර්ෂ 04 ක එකතු වටිනාකම රු.721,241 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණි.	සියළු නිවැරදි කිරීම් මීළඟ මූල්‍ය ප්‍රකාශනයෙන් නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය.
(ඔ)	සමාලෝචිත වර්ෂයට අදාළ ප්‍රාග්ධන වියදම් වැය ශීර්ෂයන් 02 ක වටිනාකම රු.58,773,997 ක වැඩියෙන් හා ප්‍රාග්ධන වියදම් වැය ශීර්ෂයන් 02 ක වටිනාකම රු.58,070,706 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණි.	මේ සම්බන්ධව සියළු නිවැරදි කිරීම් මීළඟ මූල්‍ය ප්‍රකාශනයෙන් නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය.

1.6.3 නොසැසඳුණු පාලන ගිණුම

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනට වත්කම් විෂයන් 07 ක හා වගකීම් විෂයන් 06 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය හා උපලේඛන අනුව ශේෂය අතර රු.55,009,948 ක වෙනසක් පැවතුණි.	2025 වසරේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව.	උපලේඛන අනුව ශේෂ හා මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ ගැලපෙන පරිදි නිවැරදි කළ යුතුය.
(ආ)	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයට අනුව වර්ෂය තුල වත්කම් අත්පත් කරගැනීම් වටිනාකම රු.10,709,836 ක් වුවත් ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනයට රු.10,351,682 ක් ලෙස සටහන් වීම හේතුවෙන් රු. 358,154 ක වෙනසක් පැවතුණි.	2025 වසරේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව.	මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.40,208,198 ක් වුවත් එය ශුද්ධ වත්කම් වෙනස්විමේ ප්‍රකාශයට රු.6,139,451 ක් ලෙස සටහන් වීම හේතුවෙන් රු.34,068,747 ක වෙනසක් පැවතුණි.	2025 වසරේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව.	මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මෝටර් රථ හා කරත්ත 21 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂය හා ස්ථාවර වත්කම් ලේඛනයේ දැක්වෙන ශේෂය අතර රු.38,526,535 ක වෙනසක් පැවතුණි.	ඉදිරියේදි ස්ථාවර වත්කම් ලේඛනය නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ස්ථාවර වත්කම් ලේඛනය නිවැරදිව පිළියෙල කළ යුතුය.

1.6.4 විගණනය සඳහා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ශේෂ සනාථ කිරීම් හා උපලේඛන ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.366,294 ක් වූ ගිණුම් විෂයයන් 04 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.	වසර ගණනාවක් තිස්සේ ඉදිරියට යන ශේෂයක් වන අතර ශේෂය සැදුම්ලත් ආකාරය පිළිබඳ තොරතුරු කිසිවක් නොමැති බව.	මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් තහවුරු කර ගැනීමට අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය.

1.7 අනුකූල නොවීම

1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ මුදල් රෙගුලාසි			
(i)	මු. රෙ. 371(3)	වටිනාකම රු.410,043 ක් වූ අත්තිකාරම් දෙසැම්බර් 31 දින වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය.
(ii)	මු.රෙ. 571(2)	වටිනාකම රු.999,147 ක් වූ වසර 02 ක කාලය ඉක්ම වූ මිශ්‍ර තැන්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි.	2025 වර්ෂයේ දී නිරවුල් කිරීමට කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය.
(iii)	මු. රෙ. 893	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාම යාම හා ස්ථානමාරු වූ නිලධාරීන් 08 දෙනෙකුගේ වටිනාකම රු.121,842 ක ඇප නිදහස් කිරීමට කටයුතු කර නොතිබුණි.	2025 වර්ෂයේ සියළුම ඇප මුදල් නිදහස් කිරීමට කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය.
(ආ)	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ			
(i)	2002 පෙබරවාරි 25 දිනැති අංක 01/2002 චක්‍රලේඛය	සභාව සතු වාහන 26 ක ආයතනයේ නම සමඟ රාජ්‍ය ලාංඡනය සලකුණු කර නොතිබුණි.	රාජ්‍ය ලාංඡන පින්තාරු කර නොමැති වාහනවල මෙම ලාංඡන පින්තාරු කිරීමට කටයුතු කරන බව.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය.

(ii)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3(1) ඡේදය	ප්‍රාදේශීය සභාවට අයත් වාහන 17 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛ ප්‍රකාරව ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර නොතිබුණි.	පළාත් පාලන යාන්ත්‍රික ඉංජිනේරුවන් දැනුවත් කර ඉදිරියේදී ඉන්ධන දහනය පරීක්ෂාව සිදු කිරීමට කටයුතු කරන බව.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඇ)	2023 මාර්තු 09 දිනැති අංක NWP/ CS/AD/12/6-3 දරන පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ ඇප සම්බන්ධයෙන් චක්‍රලේඛය	සමලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවකයින් 06 දෙනෙකු ඇප තබා තිබූ අතර අනෙකුත් ඇප තැබිය යුතු නිලධාරීන් 10 දෙනෙකු චක්‍රලේඛය ප්‍රකාරව ඇප තබා නොතිබුණි.	ඉතිරිකිරීම් ගිණුම් විවෘත කිරීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතින අතර ජනවාරි මස සිට වැටුපෙන් ඇප තැන්පත් අයකිරීමට නියමිතයි.	චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,697,558 ක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.18,481,614 ක් විය.

2.2 මූල්‍ය පාලනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලංකා බැංකු ජංගම ගිණුමේ මුදල් පොතට අනුව ශේෂය හා මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය අතර රු.253,488 ක වෙනසක් පැවතුණි.	CAT මෘදුකාංගය යටතේ මාර්ගගත ගෙවීම් (online payment) කිරීමේදී සිදු වූ වෙනස්කමකි.	වෙනස හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව සටහන් කළ යුතුය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තු ගත ආදායම් ,බිල්කළ ආදායම් ,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	2024 වර්ෂය				2023 වර්ෂය			
ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තුගත ආදායම	බිල් කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තු ගත ආදායම	බිල් කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000
වරිපනම් හා බදු	5,411	5,903	6,679	7,599	3,911	3,911	2,646	8,371
කුලී	13,550	13,550	13,941	663	3,801	10,339	10,513	852
බලපත්‍ර ගාස්තු	500	279	279	-	500	500	640	-
වෙනත් ආදායම්	20,150	40,000	84,939	28,163	35,050	35,050	12,220	73,102
එකතුව	39,611	59,732	105,838	36,425	43,262	49,800	26,019	82,325

2.3.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ බිල්කළ ආදායම රුපියල් මිලියන 59.7 ක් වූ අතර පෙර වර්ෂයන්ට අදාලව හිඟ ආදායම් ලැබීම්ද ඇතුළුව රුපියල් මිලියන 105.8 ක් සමාලෝචිත වර්ෂයේ රැස්කර තිබුණි. ඉකුත් වර්ෂවල හිඟ සමඟ සමාලෝචිත වර්ෂය අවසානයේ දී රුපියල් මිලියන 36.4 ක් තව දුරටත් අයකර ගැනීමට පැවතුණි.	ඉතිරි හිඟය තවදුරටත් අයකර ගැනීමට කටයුතු කරගෙන යමින් පවතින බව.	හිඟ ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	**වරිපනම් හා බදු**		
(i)	සමාලෝචිත වර්ෂයේ ආරම්භයට පැවති රු.8,371,000 ක හිඟයෙන් රු.4,879,763 ක මුදලක්ද, බිල්කිරීම් රු.5,903,000 ක මුදලින් රු.2,719,274 ක මුදලක්ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	ඉතිරි හිඟ මුදල් ඉතා කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව.	හිඟ ආදායම් හා බිල්කළ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.593,477 ක හිඟ අක්කර බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	ඉඩම් පවුලේ සාමාජිකයන් අතරේ බෙදී යාම, ඉඩම් කොටස් කර විකිණීම, අක්කර බදු ගොවිජන සේවා මධ්‍යස්ථානයට ගෙවීම් කිරීම, මුල් අයිතිකරුවන් මිය යාම යන හේතු නිසා අක්කර බදු ගෙවීම පැහැර හරින බව.	හිඟ ආදායම් හා බිල්කළ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	**කුලී**		
(i)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කඩ කුලී හා වත්කම් බදු දීම් මත කුලී රු.662,941 ක් අයකර නොතිබුණි.	හිඟය ඉදිරියේදි අය කර ගැනීමට කටයුතු කරන බව.	හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	2024 දෙසැම්බර් 31 දිනට රු.288,000 ක හිඟ කුලී මුදලක් රාජ්‍ය අංශයේ ආයතනයකින් අයකර ගැනීමට තිබුණි.	හිඟ මුදල් අය කර ගැනීමට අවශ්‍යය කටයුතු කරමින් පවතින බව.	හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඈ)	**වෙනත් ආදායම්**		
	පළාත් සභාවේ ලේකම්වරයාගේ සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ සහ මුද්දර ගාස්තු පිළිවෙලින් රු.699,541 ක් හා රු.28,162,963 ක් ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.	උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කරන බව	හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳව කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කල යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳ නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

3.1 ආර්ථික නොවූ ගණුදෙනු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
රු.279,000 ක් වැයකර ගලි ප්‍රතිකර්ම පද්ධතියේ පෙරුම් මාධ්‍ය සැකසීම 2021 මැයි 31 දින අවසන් කර තිබුණද, 2021 නොවැම්බර් 30 වන විට ගලි ප්‍රතිකර්ම පද්ධතිය අක්‍රිය වී තිබුණි. එය යථා තත්ත්වයට පත්කිරීමට 2025 මාර්තු වන විටත් කටයුතු කර නොතිබුණි.	විශේෂඥ උපදෙස් ලබා ගෙන නිවැරදි කිරීමට කටයුතු කරන බව.	පෙරුම් මාධ්‍ය යථා තත්ත්වයට පත්කර, ගලි බැහැර කිරීමට කටයුතු කළ යුතුය.

3.2 කළමනාකරණ ආකායර්ක්ෂමතා

	විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	පසුගිය වසරට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ දිරන කසල රැස්කිරීමේ ප්‍රගතිය සියයට 25 කින් වැඩි වී තිබුණද කොම්පෝස්ට් නිෂ්පාදනය හා අලෙවියෙන් ලද ආදායම පිළිවෙලින් සියයට 84 කින් හා සියයට 82 කින් අඩු වී තිබුණි.	බොබ්කැට් යන්ත්‍රය හා හලර් යන්ත්‍රය ක්‍රියා විරහිත වීම මූලික හේතුවක් වී තිබුණු බව.	පොහොර නිෂ්පාදනය වැඩිකර ආදායම වැඩි කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් 17 ක පැවති රු.61,685,154 ක ශේෂයෙන් වසර 5 ක කාලය ඉක්මවූ රු.3,612,841 ක ශේෂයක් පැවතුණි.	ලැබිය යුතු ගිණුම් ශේෂ අයකර ගැනීමට කටයුතු කරන බව.	ලැබිය යුතු මුදල් අප්‍රමාදීව අයකර ගැනීමට කටයුතු කල යුතුය.
(ඇ)	වර්ෂ 10 කට අධික කාලයක සිට පැවත එන රු.93,989 ක අත්තිකාරම් ශේෂ 09 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	මෙම ශේෂ පොත්වලින් ඉවත් කිරීමට තවදුරටත් කරුණු සොයමින් පවතින බව.	ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් 20 ක පැවති රු.74,346,277 ක ශේෂයෙන් වසර 05 ක කාලයක් ඉක්මවා තිබුණු රු.4,781,120 ක ශේෂයක් පැවතුණි. මේවායේ පැවැත්ම කෙරෙහි සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	ගෙවිය යුතු ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ගෙවිය යුතු ගිණුම් ශේෂවල පැවැත්ම සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

3.4 මත භේදයට තුඩු දෙන ගණුදෙනු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 ජනවාරි 01 දිනට පැවති ගෙවිය යුතු උපයන විට බදු හා කර්මාන්ත අත්තිකාරම් ශේෂයන්ගේ එකතුව රු.97,927 ක් වර්ෂය තුළ අනුමැතියකින් තොරව සමුච්චිත අරමුදලට කපා හැර තිබුණි.	2025 වසරේ අවසන් ගිණුමෙන් ඊට අදාල ලිපි ඉදිරිපත් කරන බව.	ගෙවිය යුතු ගිණුම් කපා හැරීමේදී අවශ්‍ය අනුමැතීන් ලබාගෙන ඒ අනුව කටයුතු කළ යුතුය.

3.5 නිෂ්කාර්ය හෝ ඌණ උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාව සතු කැබ් රථයක් හා ට්‍රැක්ටර් ට්‍රේලරයක් අපහරණය කිරීම සඳහා පිළිවලින් 2015 හා 2019 වර්ෂවල හඳුනාගෙන තිබුණ ද සමාලෝචිත වර්ෂය වන විටත් එම වාහන අපහරණය කර නොතිබුණි.	පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන යාන්ත්‍රික ඉංජිනේරුතුමාගේ නිර්දේශය අනුව අපහරණය කිරීමට කටයුතු කරන බව.	අනුමැතීන් ලබාගෙන අපහරණය කිරීමට කටයුතු කළ යුතුය.

3.6 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාව සතු මෝටර් රථ හා කරත්ත තුළ ඇතුළත් රු.117,340 ක් වටිනා කසල කරත්ත/ අත් කරත්ත 04 ක් හා පා පැදි 02 ක් භෞතිකව නොතිබුණි.	මෙම අත්කරත්ත සහ පාපැදි පිළිබඳව සොයා බලා ඉදිරි කටයුතු කරන බව.	සභාවේ වත්කම්වල පැවැත්ම හා ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය.
(ආ)	2016 සිට 2024 දෙසැම්බර් 31 අතර කාලය තුළ ගැල්වනයිස් බට 435 ක් අස්ථානගත වී ඇති ඇති අතර ඒ සම්බන්ධයෙන් අදාළ වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	පෙර සිටි ප්‍රාදේශීය සභා සභිකයින් විසින් GI බට 158 ප්‍රමාණයක් හා තවත් බට 180ක් කුරුණෑගල ප්‍රාදේශීය සභාවට රැගෙන ගොස් ආපසු භාරදී නොමැත. ඒ පිළිබඳව සභිකවරුන් දැනුවත් කර ආපසු ලබා දෙන ලෙස දන්වා ඇති බව.	වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන සභාවට සිදුවූ අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

3.7 කොන්ත්‍රාත් පරිපාලනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සංවර්ධනය කිරීමට යෝජිත මාර්ග අදාල පළාත් පාලන ආයතනයෙන් විමසීමෙන් හා ශක්‍යතා අධ්‍යානයකින් තොරව දිස්ත්‍රික් සංවර්ධන කමිටුව හරහා තෝරා ගැනීම නිසා බල ප්‍රදේශය තුළ ප්‍රමුඛතාවය අනුව සංවර්ධනය කළ යුතු මාර්ග තෝරා නොගෙන ප්‍රතිලාභීන් අඩු පවුල් ප්‍රමාණයක් සහිත මාර්ග තෝරාගෙන තිබුණි.	2024 කඳුකර දශකය වැඩ සටහන යටතේ ලැබී ඇති යෝජනා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ලැබුණ යෝජනා වන අතර, මෙහි සඳහන් මාර්ග ප්‍රාදේශීය සභාව සතු මාර්ග වන බැවින් අප ආයතනයේ තාක්ෂණ නිලධාරීන් මඟින් ඒ සඳහා ඇස්තමේන්තු සැකසීම හා අධීක්ෂණය පමණක් සිදු කර ඇති බව.	ආයතන අතර මනා සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් ප්‍රමුඛතාවය අනුව සංවර්ධන කටයුතු කිරීමට කටයුතු කළ යුතුය.

3.8 මානව සම්පත් කළමනාකරණය

(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත

	විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(i)	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත නොවූ තනතුරු 07 ක් සඳහා සේවකයින් 13 දෙනෙකු සභාව විසින් බඳවාගෙන තිබුණි.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇති නමුත් මේ වන තෙක් අදාල අනුමත වීම් ලැබී නොමැති බව.	අනුමත බඳවා ගැනීම් පටිපාටිය අනුව කටයුතු කළ යුතුය.
(ii)	බඳවාගත් තනතුරට අදාළ රාජකාරි ඉටු නොකරමින් වෙනත් තනතුරක රාජකාරී ඉටු කිරීමට නිලධාරීන් 14 දෙනෙකු යොදවා තිබුණි.	සේවයේ පුරප්පාඩු ඇති වීම මත එම කාර්යය සපුරා ගැනීමේ අවශ්‍යතාවය අනුව යොදවා ගෙන ඇති බව.	බඳවා ගැනීමේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය

(ආ) සේවක ණය

විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
සමාලෝචිත වර්ෂය අවසාන දිනට විශ්‍රාම යෑම / ස්ථාන මාරුවීම වැනි කරුණු හේතුවෙන් නිලධාරීන් 10 දෙනෙකුගෙන් රු. 125,833 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	විශ්‍රාම වැටුපෙන් අය කර ගැනීමට හා ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරන බව	හිඟ ණය ශේෂය අය කර ගැනීමට කටයුතු කළ යුතුය.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 වාෂරීක ක්‍රියාකාරී සැලැස්ම

විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව කර්මාන්ත අංශයේ සැලසුම් කළ ව්‍යාපෘති 20 න් රු.16,000,000 ක ව්‍යාපෘති 08 ක් ඉටුකර නොතිබුණි.	ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත ව්‍යාපෘතිය ඉටුකර නොතිබුණි.	අයවැය ප්‍රතිපාදන මත සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමට ක්‍රියා කළ යුතුය.

4.2 පාරිසරික ගැටළු

විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
ප්‍රාදේශීය සභාව විසින් ගලි ප්‍රතිකර්ම මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා 2017 වර්ෂයේදී රු.5,149,260 ක මුදලක් වැයකර තිබුණද එය ප්‍රයෝජනයට නොගැනීම හේතුවෙන් දැනට සභාව විසින් ගලි අපද්‍රව්‍ය නිසි ප්‍රමිතියකින් තොරව කපන ලද වලකට මුදා හැර තිබුණි.	මේ සම්බන්ධව කුරුණෑගල විසල් මළ අපවහන ව්‍යාපෘතියේ ඉංජිනේරු උපදෙස් ලබා ගැනීමට හා පළාත් පාලන කොමසාරිස් දැනුවත් කර ඇති බව.	පරිසරයට හානි දායක නොවන පරිදි මල අපද්‍රව්‍ය බැහැර කිරීම කළ යුතුය.

4.3 තිරසාර සංවධර්න ඉලක්ක

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
තිරසාර සංවර්ධන අරමුණ සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව විසින් දැනුවත්ව සභා බලප්‍රදේශයේ ජනතාවගේ විවිධ වූ අවශ්‍යතා වෙනුවෙන් රු.1,350,886 ක් වැයකර වැඩසටහන් 15 ක් ක්‍රියාත්මක කර තිබුණි.	2025 වර්ෂයේදී ද ඉලක්ක ගත වැඩසටහන් ක්‍රියාත්මක වෙමින් පවතින බව.	තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුය.